# ශ්‍රී ලංකා වරාය අධිකාරිය

# තනතුරු පුරප්පාඩු

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම් කරනු ලබන්නේ කුමන වරායේ පුරප්පාඩු සඳහාද යන්න අයදුම්පතෙහි පැහැදිලිව සඳහන් කළ යුතුය. එක් එක් වරාය සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය වේ.

**01. තනතුර : වැඩ අධිකාරි (සිවිල්) - (කොළඹ ගාල්ල ත්‍රිකුණාමලය ) (Work Superintendent – (Civil))**

**(Colombo) Galle / Trincomalee)**

**(පුරප්පාඩු සංඛ්‍යාව : 08)**

(අ) **වැටුප :**

| | |
|---|---|
| ශ්‍රේණිය සහ වැටුප් කේත අංකය | : අධි ශ්‍රේණිය - 6.3 ( SG 3 ) |
| මූලික වැටුප් පියවර | : රු. 53,425/= |
| වාර්ෂික වේතනාධිකය | : රු. 1,150/= |

(දළ වැටුප මාසිකව රු. 132,000/= ක් පමණ වේ.)

(ආ) **සුදුසුකම් :**

අ. පො. ස (උ. පෙළ) විභාගය එකවර විෂයයන් තුන (03) කින් සමත්වීම

**සහ**

ක්ෂේත්‍රයට අදාළ උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (HNDE) හෝ ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (NDT) හෝ උසස් ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (HNDT) හෝ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (NDES) හෝ ඉංජිනේරු ඩිප්ලෝමාව - ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය (ED - OUSL) හෝ City & Guilds ආයතනයේ අවසන් සහතිකය හෝ රජයේ හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික හෝ වෘත්තීය පුහුණු ආයතනයක් මගින් නිකුත් කරනු ලබන ඒ හා සමාන ඩිප්ලෝමාව

**සමඟ**

**පළපුරුද්ද**

රජයේ හෝ පිළිගත් පුද්ගලික ආයතනයක වැඩ අධිකාරී හෝ ඒ හා සමාන තනතුරක වසර තුන (03) ක පළපුරුද්ද

(ඇ) **වයස් සීමාව :**

අවු. 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි අය විය යුතුය.

රාජ්‍ය සේවයේ අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාළ නොවනු ඇත.

මෙම තනතුර සඳහා අයදුම්කරන සේවා මුක්ත භටයින්ට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අංක 299 හා 1985.07.23 දින දරන චක්‍රලේඛ ප්‍රතිපාදන අදාළ වනු ඇත.

**02. තනතුර : උපදේශක ප්‍රදර්ශක (සිවිල්) (Instructor Demonstrator (Civil)) (පුරප්පාඩු සංඛ්‍යාව : 01)**

(අ) **වැටුප :**

| | |
|---|---|
| ශ්‍රේණිය සහ වැටුප් කේත අංකය | : අධි ශ්‍රේණිය - 6.3 (SG 3) |
| මූලික වැටුප් පියවර | : රු.53,425/= |
| වාර්ෂික වේතනාධිකය | : රු. 1,150/= |

(දළ වැටුප මාසිකව රු. 132,000/= ක් පමණ වේ.)

(ආ) **සුදුසුකම්:**

අ.පො.ස (උ.පෙළ) විභාගය එකවර විෂයයන් තුන (03) කින් සමත්වීම

**සහ**

සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයට අදාළ උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (HNDE) හෝ ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (NDT) හෝ උසස් ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (HNDT) හෝ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (NDES) හෝ ඉංජිනේරු ඩිප්ලෝමාව - ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය (ED-OUSL) හෝ තාක්ෂණික ඩිප්ලෝමාව - ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය (DTec-OUSL) හෝ City & Guilds ආයතනයේ උසස් ඩිප්ලෝමාව හෝ රජයේ හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික හෝ වෘත්තීය පුහුණු ආයතනයක් මගින් නිකුත් කරනු ලබන ඒ හා සමාන ඩිප්ලෝමාව

**සමඟ**

**පළපුරුද්ද**

රජයේ හෝ පිළිගත් පුද්ගලික ආයතනයක සමාන තනතුරක වසර පහ (05) ක පළපුරුද්ද

(ඇ) අනෙකුත් අනිවාර්යය අවශ්‍යතා :

පුහුණුවන්නන් පුහුණු කිරීමේ සහතිකය

(ඈ) **සටහන :**

පුහුණු කිරීම් සම්බන්ධ පළපුරුද්ද සහ ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය ඇති අය සඳහා ප්‍රමුඛතාවය ලබාදෙනු ලැබේ.

(ඉ) **වයස් සීමාව:**

අවු. 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි අය විය යුතුය.

රාජ්‍ය සේවයේ අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාළ නොවනු ඇත.

මෙම තනතුර සඳහා අයදුම්කරන සේවා මුක්ත භටයින්ට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අංක 299 හා 1985.07.23 දින දරන චක්‍රලේඛ ප්‍රතිපාදන අදාළ වනු ඇත.

**03. තනතුර : උපදේශක ප්‍රදර්ශක (උපකරණ මෙහෙයුම් - ගැන්ට්‍රි/ ට්‍රාන්ස්ෆර් දොඹකර)**

**(Instructor Demonstrator (Equipment Operations - Gantry/ Transfer Crane))**

**(පුරප්පාඩු සංඛ්‍යාව : 01)**

**04. තනතුර : උපදේශක ප්‍රදර්ශක (උපකරණ මෙහෙයුම් - ප්‍රයිම්මුවර් / අඹු එසවුම් යන්ත්‍ර)**

**(Instructor Demonstrator (Equipment Operations - (Prime Mover/ Forklift))**

**(පුරප්පාඩු සංඛ්‍යාව : 01)**

(අ) **වැටුප :**

| | |
|---|---|
| ශ්‍රේණිය සහ වැටුප් කේත අංකය | : අධි ශ්‍රේණිය - 6.3 (SG 3) |
| මූලික වැටුප් පියවර | : රු .53,425/= |
| වාර්ෂික වේතනාධිකය | : රු. 1,150/= |

(දළ වැටුප මාසිකව රු. 132,000/= ක් පමණ වේ.)

(ආ) **සුදුසුකම් :**

අ.පො.ස (උ.පෙළ) විභාගය එකවර විෂයයන් තුන (03) කින් සමත්වීම

**සහ**

ක්ෂේත්‍රයට අදාළ උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (HNDE) හෝ ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (NDT) හෝ උසස් ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (HNDT) හෝ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (NDES) හෝ ඉංජිනේරු ඩිප්ලෝමාව - ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය (ED-OUSL) හෝ තාක්ෂණික ඩිප්ලෝමාව - ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය (DTec- OUSL) හෝ City & Guilds ආයතනයේ උසස් ඩිප්ලෝමාව හෝ රජයේ හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික හෝ වෘත්තීය පුහුණු ආයතනයක් මගින් නිකුත් කරනු ලබන ඒ හා සමාන ඩිප්ලෝමාව

**සමඟ**

**පළපුරුද්ද**

රජයේ හෝ පිළිගත් පුද්ගලික ආයතනයක සමාන තනතුරක වසර පහ (05) ක පළපුරුද්ද

(ඇ) අනෙකුත් අනිවාර්යය අවශ්‍යතා :

i. A ශ්‍රේණියේ රියදුරු උපදේශක සහතිකය සහ බලපත්‍රය ලබා තිබීම
ii. පුහුණුවන්නන් පුහුණු කිරීමේ සහතිකය

(ඈ) **සටහන :**

පුහුණු කිරීම් සම්බන්ධ පළපුරුද්ද සහ ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය ඇති අය සඳහා ප්‍රමුඛතාවය ලබාදෙනු ලැබේ.

(ඉ) **වයස් සීමාව:**

අවු. 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි අය විය යුතුය.

රාජ්‍ය සේවයේ අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාළ නොවනු ඇත.

මෙම තනතුර සඳහා අයදුම්කරන සේවා මුක්ත භටයින්ට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අංක 299 හා 1985.07.23 දින දරන චක්‍රලේඛ ප්‍රතිපාදන අදාළ වනු ඇත.

**05. තනතුර : උපදේශක ප්‍රදර්ශක (නාවුක හා නාවුකත්ව)**

**(Instructor Demonstrator (Maritime and Seamanship))**

**(පුරප්පාඩු සංඛ්‍යාව : 01)**

(අ) **වැටුප :**

| | |
|---|---|
| ශ්‍රේණිය සහ වැටුප් කේත අංකය | : අධි ශ්‍රේණිය - 6.3 (SG 3) |
| මූලික වැටුප් පියවර | : රු.53,425/= |
| වාර්ෂික වේතනාධිකය | : රු.1,150/= |

(දළ වැටුප මාසිකව රු. 132,000/= ක් පමණ වේ.)

(ආ) **සුදුසුකම් :**

අ.පො.ස (උ.පෙළ) විභාගය එකවර විෂයයන් තුන (03) කින් සමත්වීම

**සහ**

නාවුක හා නාවුකත්ව ඉංජිනේරු ක්ෂේත්‍රයට අදාළ ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (NDT) හෝ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (NDES) හෝ නාවුකත්ව ඉංජිනේරු උසස් ඩිප්ලෝමාව හෝ නාවුක විද්‍යාව පිළිබඳ උසස් ඩිප්ලෝමාව හෝ ඒ හා සමාන ඩිප්ලෝමාව

**හෝ**

වෙරළාසන්න මුහුදු ගමන් (NCV) වල යෙදෙන දළ බර 3000 කට නොඅඩු නෞකාවන්හි නාවිකයෙකු වශයෙන් සේවයේ නියැලීම පිණිස ශ්‍රී ලංකා වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලැබූ හෝ පිළිගනු ලැබූ වලංගු ප්‍රවීණතා සහතිකය

**සමඟ**

**පළපුරුද්ද**

රජයේ හෝ පිළිගත් පුද්ගලික ආයතනයක සමාන තනතුරක වසර පහ (05) ක පළපුරුද්ද සමඟ අවම වශයෙන් වසර එක (01) ක මුහුදු ගමන් පළපුරුද්ද

(ඇ) අනෙකුත් අනිවාර්යය අවශ්‍යතා :

පුහුණුවන්නන් පුහුණු කිරීමේ සහතිකය

(ඈ) **සටහන:**

පුහුණු කිරීම් සම්බන්ධ පළපුරුද්ද සහ ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය ඇති අය සඳහා ප්‍රමුඛතාවය ලබාදෙනු ලැබේ.

(ඉ) **වයස් සීමාව:**

අවු. 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි අය විය යුතුය.

රාජ්‍ය සේවයේ අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාළ නොවනු ඇත.

මෙම තනතුර සඳහා අයදුම්කරන සේවා මුක්ත භටයින්ට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අංක 299 හා 1985.07.23 දින දරන චක්‍රලේඛ ප්‍රතිපාදන අදාළ වනු ඇත.

**වෙනත්**

සෑම අයදුම්කරුවෙකුම,

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍යවන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
iii. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.
iv. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ තීරණ අනුව හෝ තනතුරට අදාළ වනුයේ නම් වෛද්‍ය පරීක්ෂණයෙන්ද සමත් විය යුතුය.
v. මෙම තනතුර ස්ථිර තනතුරක් වන අතර සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලට හිමිකම් කියයි.
vi. රජයේ හෝ රාජ්‍ය සංස්ථාවන්හි සේවයේ නියුතු අපේක්ෂකයින් තම අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු/ සංස්ථා ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර, ඉහත තනතුරු සඳහා අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් අදාළ දෙපාර්තමේන්තු/ සංස්ථා සේවයෙන් මුදා හැරීමට එකඟ වන බවට සටහනක් තිබිය යුතුය.

සම්පූර්ණ ජීවදත්ත ඇතුළත්ව උප්පැන්න සහතිකය, අනෙකුත් අදාළ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් සහතික, සේවා සහතික වල පිටපත් සමග ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සහිතව සකස් කළ අයදුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් 2026.11.06 දිනට පෙර පහත දක්වා ඇති ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය.

තැපෑලේදී අස්ථානගත වන හෝ ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් පිළිබඳව ශ්‍රී ලංකා වරාය අධිකාරිය වග කියනු නොලැබේ. අදාළ අයදුම්පත් බහලු කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. **අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් සහ පරිපාලන),**
**මානව සම්පත් සහ පරිපාලන කොට්ඨාසය,**
**ශ්‍රී ලංකා වරාය අධිකාරිය,**
**කොච්චිකඩේ, කොළඹ 13.**

Gazette.lk